# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/27 - 2024 මැයි මස 08 වැනි බදාදා - 2024.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංකයː 4648
විශේෂ්‍ය අංකයː මඩ/126

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

මඩකලපුව, ලව්ලේන්, නො. 10, "කතිරවාස" හි පදිංචි වත්සලාදේවි මානිකවාසගර් මහත්මිය විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව, මෙම කොමිෂන් සභාව විසින්, ව්‍යවස්ථාපිත බදු ගැනුම්කාරියට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඇයට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කාරියට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

**නීතිඥ පණ්ඩුකාභය හර්ෂ කීර්තිනන්ද,**
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2024 මැයි මස 08 වැනි දින,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

01. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තු ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, තිරුක්කෝවිල් යන ගමේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක අම් 513 හි දැක්වෙන චෝලයිකාඩු නමැති ඉඩමේ නොබෙදූ අක්කර 27, රූඩ් 2, පර්චස් 18 ක ප්‍රමාණ ඇති කැබලි අංක 4 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද.

02. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තු ප්‍රා.ආ.නි. කොට්ඨාසයේ, තිරුක්කෝවිල් යන ගමේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක අම් 507 හි දැක්වෙන කන්දරාජා එස්ටේට් නමැති ඉඩමේ අක්කර 22, රූඩ් 1, පර්චස් 22 ක ප්‍රමාණ ඇති කැබලි අංක 1 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද වේ.

EOG 05 - 0068

1A - PG 6721 — 14 (2024/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*